12(1)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022-12-21

පැමිණිලිකරු : කේ.පී.බී. නිශ්ශංක මයා,
13/1 ඒ, තොටගමුව වත්ත,
පලාපත්වල, මාතලේ.

වගඋත්තරකරුවන් : 01. ලේකම්, - CPC/PSC/39/SD/ අධ්‍යක්ෂ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව (මධ්‍යම පළාත),
අංක. 244, කටුගස්තොට පාර,
මහනුවර.

02. ලේකම්,
මධ්‍යම පළාත් ක්‍රීඩා හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය,
තැ.පෙ. 41,ගැටඹේ,
පේරාදෙණිය.

<u>පැමිණිලි අංකය : **HRC/K/06/17 – I**</u>

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :-**

පැමිණිලිකාර කේ.පී.බී නිශ්ශංක යන අය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින්, තමා මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරියෙකු ලෙස සේවයේ යෙදි සිටියදී ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුරෙහි ඇති වූ පුරප්පාඩුව මත මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා විසින් 2013.07.14 දින දිස්ත්‍රික් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා පත්කර ඇති බවත් එම තනතුරේ සේවයේ යෙදී සිටිය දි මධ්‍යම පළාත් ක්‍රීඩා කේන්ද්‍රයේ නිලධාරීන් පත්වීම හා උසස් කිරීමට අදාළ සේවක ව්‍යවස්ථාවට අනුව අදාළ සුදුසුකම් සපුරා තිබූ බැවින් එම තනතුර ස්ථිර කර දෙන ලෙස ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් මඟින් මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයාගෙන් 2014.04.02 ඉල්ලීම් කළද එය ඉටු නොවූ බවත් සඳහන් කර ඇත. එබැවින් නැවතත් 2015.04.02 දින ඉල්ලීමක් කළද ඊටද කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වූ බවත් පසුව වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත 2016.02.21 දින දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි තනතුරින් විශ්‍රාම යන ලද බවත් සඳහන් කර ඇත. විශ්‍රාම යාමෙන් පසුද ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර ස්ථිර කර දෙන ලෙස කරන ලද ඉල්ලීමට 2016.12.01 දිනැති ලිපියෙන් ප්‍රතිචාර දක්වමින්, මධ්‍යම

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පළාත් ආණ්ඩුකාරවරයා විසින් "මධ්‍යම පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පංතියේ තනතුරක් බැවින් තමා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු නොවීම හේතුවෙන් එම තනතුර ස්ථිර කළ නොහැකි බව" දන්වා ඇති බවද සඳහන් කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

පළවන වගඋත්තර පාර්ශවය වන මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙනුවට සහකාර ලේකම් ටී.පී. දෙහිගොල්ල මහත්මිය කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිට ඇත.

පැමිණිලිකාර කේ.පී.බී නිශ්ශංක මහතා මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ වැඩ බලන ක්‍රීඩා අධ්‍යක්ෂ ලෙස 2013.07.04 සිට 2016.02.21 දක්වා සේවය කළද එම තනතුරේ ස්ථිර කිරීම සඳහා හැකියාවක් නොමැති බවට සඳහන් කර ඇති අතර, ඊට හේතුව ලෙස දක්වා ඇත්තේ මධ්‍යම පළාත් සභාවේ අනුමත කාර්ය මණ්ඩල වාර්තාව අනුව ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (SLAS) II පංතියේ SL1-2006 වැටුප් පරිමාණයට අදාළ තනතුරක් වීම බවයි. එමෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ අංක 1419/3 හා 2005.11.14 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු ලැයිස්තුවට අනුව 2015.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පළාත් සභාවල හා පළාත් දෙපාර්තමේන්තුවල අධ්‍යක්ෂ තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතු අතර 1998.05.28 දින අනුමත කරන ලද ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවය පිළිබඳ ව්‍යවස්ථාපිත සංග්‍රහයට අනුව පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් වනුයේ මධ්‍යම පළාත් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ඒකාබද්ධ සේවයේ III පංතියේ II ශ්‍රේණියේ වසර 5 ක සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබිය යුතුයි යන්න වන බවත්, ඒ අනුව මෙම තනතුර සඳහා පත්කරනුයේ විධිමත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් බවත් සඳහන් කර ඇත. ඒ සඳහා පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් හෝ සමාන නියෝජිතයෙක්, පළාත් ප්‍රධාන ලේකම් හෝ සමාන නියෝජිතයෙක් හා ක්‍රීඩා විෂයභාර අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ද සහභාගි විය යුතු අතර, පත් කිරීම කරනුයේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වන බවද දක්වා ඇත.

ඉහත පරිදි පැමිණිලිකරු අදාළ තනතුර සඳහා පත් වී නොමැති අතර. විධිමත් ලෙස පත් කිරීමක් සිදු කරන තෙක් දිස්ත්‍රික්ක ක්‍රීඩා නිලධාරියෙක් ලෙස සිටි පැමිණිලිකරු 2013.07.04 දින සිට මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් මධ්‍යම පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා පත්කර ඇති බවත්, බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා නොමැති නිසා පැමිණිලිකරු එම තනතුරේ ස්ථිර කිරීමට හැකියාවක් නොමැති බවත් සඳහන් කර ඇත.

දෙවන වගඋත්තර පාර්ශවය වන මධ්‍යම පළාත් ක්‍රීඩා හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් සහභාගි වූ පරිපාලන නිලධාරි ඩබ්ලිව්.ඒ. අමරාංගනි මහත්මිය විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරු ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ වැඩ බැලීම සඳහා මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමන් විසින් අංක CGC/1/4/6 (iv) හා 2013.07.04 දිනැති ලිපිය මඟින් පත්කර ඇති බවයි. ඒ සඳහා ඔහු වෙත වැඩ බැලීමේ දීමනාවක් ගෙවා ඇති අතර, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ

2013.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කාර්ය මණ්ඩල වාර්තාව හා සේවක සංඛ්‍යා කොමිෂන් සභා නිර්දේශය අනුව මධ්‍යම පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ SLI-2006 වැටුප් කේතය යටතේ පවත්වන II ශ්‍රේණියේ තනතුරක් වන බවත් පැමිණිලිකරු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු නොවන බැවින් ඔහු විසින් අදාළ කාලය තුල අධ්‍යක්ෂ තනතුර ස්ථිර කර දෙන ලෙස කරන ලද ඉල්ලීම් ද විවිධ අවස්ථාවල ප්‍රතික්ෂේප කර ඇති බවත් දක්වා ඇත. පැමිණිලිකරු 2016.02.21 දින විශ්‍රාම යන විට මධ්‍යම පළාත් ක්‍රීඩා නිලධාරීන්ගේ වැටුප් ව්‍යවස්ථාවට අනුව දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි වැටුප් කේත්ය වන MN-37 හි 37 වන පියවරින් විශ්‍රාම ගොස් ඇති අතර, ඒ අනුව ඔහු ජ්‍යෙෂ්ඨ ක්‍රීඩා නිලධාරි තනතුරේ වැටුප් කේතය වන MN-7 වැටුප් පියවරේ පිහිටුවීමට නිර්දේශ කොට ඇති බවත් නමුත් පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ තනතුරක් බැවින් ඒ සඳහා ක්‍රීඩා දෙපාර්තමේන්තුවට නිර්දේශ කර නොමැති බවත් සඳහන් කර ඇත.

**නිරීක්ෂණය :-**

පැමිණිලිකාර කේ.පී.ඩී නිශ්ශංක මහතා විසින් මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුරේ ඇති වූ පුරප්පාඩුවට මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් මගින් ගරු ආණ්ඩුකාරවරයාගේ 2013.06.12 දිනැති ඉල්ලීම කර ඇති බව නිරීක්ෂණය වේ.

එහි ඉල්ලීම මධ්‍යම පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් විසින් මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම් වෙත පිටපත් සහිතව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත 2013.06.17 දින යොමු කර ඇත. එකී ලිපියේ 05 වන ඡේදයේ සඳහන් වනුයේ "කේ.පී.ඩී. නිශ්ශංක මහතා ක්‍රීඩා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව නිශ්චිත සුදුසුකම් සපුරා ඇති බැවින් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර සඳහා ව්‍යවස්ථා සංග්‍රහයේ පිටපතක් ද සහිතව නිර්දේශ සහිතව ඉදිරිපත් කරන බවයි."

ඒ අනුව මධ්‍යම පළාත් ආණ්ඩුකාර(හිටපු) ටිකිරි කොබ්බෑකඩුව මහතා මෙම පැමිණිලිකරු 2013.07.04 දින සිට මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා පත් කර ඇති අතර එකී ලිපියේ "1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32(1) වගන්තිය යටතේ "මා වෙත භාර බලතල අනුව අදාළ වැඩ බැලීමට පත් කිරීමක් සිදු කරන බවට" සඳහන්ව ඇත.

1998.05.28 අනුමත ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරින්ගේ ඒකාබද්ධ සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 03 කාරණයට අදාළව මධ්‍යම පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂකවරු II පංතියේ II ශ්‍රේණියේ නිලධාරියෙක් විය යුතු බව සඳහන්ව ඇත.

එකී බඳවා ගැනීමේ දී ක්‍රියා පටිපාටිය අනුව කිහිපදෙනෙකුට 2013.01.01 දිනට ප්‍රථම පෙර කී සේවා ව්‍යවස්ථාවට අනුව ස්ථිර ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුරේ පිහිටුවා උසස් වීම ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරපාර්ශවය සඳහන් කරන අයුරින් 1998.05.28 දිනැති අනුමත ක්‍රීඩා කේන්ද්‍රයේ නිළධාරීන්ගේ ඒකාබද්ධ සේවය පිළබඳ ව්‍යවස්ථා සංග්‍රහය 2013.01.01 දින අහෝසි වී මධ්‍යම පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ තනතුරක් ලෙස අනුමත වී ඇති බව නිරීක්ෂණය වේ.

එසේ අනුමත වී පළාත් සභා තනතුරක් ඒකාබද්ධ සේවයේ තනතුරක් ලෙස පරිවර්තනය කිරීමේදී අදාල පළාත් සභාවේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගත යුතු බැවින් ඒ පිළිබඳ මතය දැනගැනීම පිණිස 2017.06.28 දිනැති ආණ්ඩුකාර ලේකම්ගෙන් විමසීමක් කරන ලද අතර, ආණ්ඩුකාර ලේකම් විසින් ලබාදුන් පිළිතුරේ සඳහන් වන්නේ 1998.05.28 දරණ පළාත් ක්‍රීඩා කේන්ද්‍රයේ නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවා ව්‍යවස්ථාව 2016.12.12 බල රහිත කර ඇති බවයි.

එහි II ඡේදයේ සඳහන් වන්නේ 1998.05.28 දින මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා කේන්ද්‍රයේ නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 2016.12.12 දින මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් බලරහිත කර ඇති බවයි. 2016.12.12 බල රහිත වන තෙක් පැමිණිලිකරු ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුරේ වැඩ බලා ඇති අතර ඔහු විශ්‍රාම ගොස් ඇත්තේ 2016.02.21 දින ය. ඒ අනුව 1998.05.28 දිනැති මධ්‍යම පළාත් සභාවේ පැරණි ව්‍යවස්ථාවට බලපානු ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකාර කේ.පී.බී නිශ්ශංක යන අය වැඩ බලන ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුරට පත්කර ඇත්තේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයාගේ 2013.07.04 දින ලිපිය මගින් වන අතර, අදාළ තනතුර සඳහා මෙතෙක් නිලධාරියෙක් පත්කර නොමැත.

ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ II පරිච්ඡේදයට අනුව වැඩ බැලීම් පත් වීම සම්බන්ධයෙන් 13.1.2 සඳහන් වනුයේ වැඩ බැලීමට පත් වීම සඳහා නිර්දේශ කරනු ලබන නිලධාරියා අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව සෑම අතින් ම සුදුසුකම් සහිත අයකු විය යුතු බවත්, එහි 13.2 හි දක්වා ඇත්තේ කිසියම් ධූරයක් තාවකාලික පුරප්පාඩුවක් ව පවතින්නේ නම් එහි වැඩ බැලීම සඳහා කිසිවෙක් පත් නොකල යුතු බවත්ය. එහි 13.3 හි සඳහන් වන්නේ පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නොවේ නම් ආයතනයේ අනෙක් අය සමඟ වැඩ බෙදා දීමක් සිදු කළ හැකි බවයි. එහි 13.4 හි සඳහන් වන්නේ වැඩ බැලීමේ පත් වීම සඳහා කිසිදු අවස්ථාවක සුදුසුකම් නොලැබූ අයෙකු පත් නොකල යුතුයි යන්නයි.

ඉහත ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන නිරීක්ෂණයේදී පෙනී යන්නේ මෙම වැඩ බැලීමට පත් කිරීම සිදුකිරීමේදී වගඋත්තර පාර්ශවයේ වාර්තාවේ සඳහන් අයුරින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II නිලධාරියෙක් හෝ සමාන සුදුසුකම් සහිත අයකු පත් කිරීමට මෙතෙක් කටයුතු කර නොමැති (2013.01.01 දින සිට) බවයි.

**නිගමනය :-**

ඉහත නිරීක්ෂණය අනුව වගඋත්තර පාර්ශවය විසින් නිසි ලෙස චක්‍රලේඛ පරිශීලනය නොකර චක්‍රලේඛ හා ආයතන සංග්‍රහයේ නීති වලට පටහැනි ලෙස, පැමිණිලිකරු විසින් සේවය ස්ථිර කර දෙන ලෙස කරන ලද ඉල්ලීම ප්‍රමාණවත් කාලය තුල ලබා නොදී කල් දැමීම තුලින් පැමිණිලිකරු අගතියට

පත්ව ඇති බැවින් වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතියේ රැකවරණය, නීතිය පසිඳලීම හා නීතිය ක්‍රියාත්මක කිරීමද සර්ව සාධාරණ විය යුත්තේය යන මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවට පරීක්ෂණයේදී අනාවරණය වී ඇති බැවින්, පැමිණිලිකරුව මධ්‍යම පළාත් සභාවේ මධ්‍යම පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ ධූරයේ ස්ථිර කිරීම හා එම තනතුරට අදාළ වැටුප් තලවල පිහිටුවීමට කටයුතු කළ යුතු බවට වගඋත්තර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.01.23 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ආචා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත : 01. අමාත්‍යතුමා,
මධ්‍යම පළාත් ක්‍රීඩා හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය,
තැ.පෙ 41, ගැටඹේ,
පේරාදෙණිය.

02. මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රාදේශීය කාර්යාලය,
මහනුවර.

B/